# ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය
## පශ්චාද් උපාධි නිර්ණායක
## එක් අවුරුදු ශාස්ත්‍රපති පාඨමාලාව

**01. SLQF 09 – 30 Credits**

**02. ලියාපදිංචිය සඳහා සුදුසුකම්**

- පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ විශ්වවිද්‍යාලයීය ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් කවර හෝ විෂයධාරාවක් යටතේ වසර 03කට නොඅඩු උපාධි පාඨමාලාවක් සමත් ව තිබීම.

  හෝ

- ප්‍රාචීන අවසාන උපාධිය ලබා තිබීම.

  හෝ

- විශ්වවිද්‍යාලයේ සනාතන සභාව මඟින් පිළිගනු ලබන වෙනත් සුදුසුකම් සපුරා තිබීම.

**03. පාඨමාලා ව්‍යුහය**

- ලිඛිත ප්‍රශ්න පත්‍ර 06කින් සති අන්ත පාඨමාලාවක් ලෙස පැවැත්වේ.

**<u>බෞද්ධ අධ්‍යයන</u>**

| | | | |
|---|---|---|---|
| 01. | බුදුසමයේ දාර්ශනික ප්‍රවණතා | - | MABS 53015 |
| 02. | බුදුසමය හා සමයාන්තර දර්ශනය | - | MABS 53025 |
| 03. | බුදුදහම හා කළමනාකරණය | - | MABS 53035 |
| 04. | බෞද්ධ මනෝ චිකිත්සාව | - | MABS 53045 |
| 05. | පර්යේෂණ ක්‍රමවේදය | - | MARM 53065 |
| 06. | බෞද්ධ සමාජ දර්ශනය හා නූතන ලෝකය | - | MABS 53055 |
| | **හෝ** | | |
| | බෞද්ධ කලාව හා ගෘහ නිර්මාණ ශිල්පය | - | MABS 53075 |

**<u>පාලි</u>**

| | | | |
|---|---|---|---|
| 01. | බුදුසමයේ දාර්ශනික ප්‍රවණතා | - | MABS 53015 |
| 02. | පාලි නිර්දිෂ්ට ග්‍රන්ථ අධ්‍යයනය | - | MAPL 53025 |
| 03. | පාලි ව්‍යාකරණ හා ගද්‍ය පද්‍ය රචනා | - | MAPL 53035 |
| 04. | නිකායාන්තර පිටක සාහිත්‍යය | - | MAPL 53045 |
| 05. | පාලි කාව්‍යය හා සාහිත්‍ය විචාරය | - | MAPL 53055 |
| 06. | පර්යේෂණ ක්‍රමවේදය | - | MARM 53065 |

**<u>සංස්කෘත</u>**

| | | | |
|---|---|---|---|
| 01. | බුදුසමයේ දාර්ශනික ප්‍රවණතා | - | MABS 53015 |
| 02. | නිර්දිෂ්ට ග්‍රන්ථ අධ්‍යයනය - I | - | MASN 53025 |
| 03. | නිර්දිෂ්ට ග්‍රන්ථ අධ්‍යයනය - II | - | MASN 53035 |
| 04. | නිර්දිෂ්ට ග්‍රන්ථ අධ්‍යයනය - III | - | MASN 53045 |
| 05. | භාරතීය සංස්කෘතිය හා ශිෂ්ටාචාරය | - | MASN 53055 |
| 06. | පර්යේෂණ ක්‍රමවේදය | - | MARM 53065 |

**<u>සිංහල</u>**

| | | | |
|---|---|---|---|
| 01. | ජනශ්‍රැතිය හා ජනජීවන අධ්‍යයනය | - | MASI 53015 |
| 02. | චිරන්තන සිංහල පද්‍ය සාහිත්‍යය | - | MASI 53025 |
| 03. | චිරන්තන සිංහල ගද්‍ය සාහිත්‍යය | - | MASI 53035 |
| 04. | සිංහල භාෂාවේ ඉතිහාසය සහ සිංහල ව්‍යාකරණය | - | MASI 53045 |
| 05. | නූතන සිංහල සාහිත්‍යය හා සාහිත්‍ය විචාරය | - | MASI 53055 |
| 06. | පර්යේෂණ ක්‍රමවේදය | - | MARM 53065 |

**04. විභාග නිර්ණායක**

- අපේක්ෂකයන් පැය 03ක ලිඛිත ප්‍රශ්න පත්‍ර 06කට පෙනී සිටිය යුතුයි.

**05. අධ්‍යයන කාලසීමාව**

- වර්ෂ එකකි.
- සෑම විෂය පත්‍රයකට ම එක් පැවරුමක් සඳහා පැය 05ක අධ්‍යයන කාලයක් බැගින් වෙන් කළ යුතු ය. උපදෙස් ලබා දීම වෙනුවෙන් පැය 01ක් හා පුස්තකාල පරිහරණය සඳහා ද පැයක් වෙන් කළ යුතු ය.

**06. පරීක්ෂණ සාමර්ථ්‍යය**

විෂය ඒකකයකින් සාමර්ථ්‍යය ලැබීම සඳහා අවම වශයෙන් ලකුණු B-ක් ලබා ගත යුතු යි. ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව සඳහා අදාළ වන ලකුණු ශ්‍රේණි පහත අයුරින් වේ.

| ලකුණු | ශ්‍රේණිය | ලකුණු අගය |
|---|---|---|
| 85 - 100 | A+ | 4.00 |
| 70 - 84 | A | 4.00 |
| 65 - 69 | A- | 3.70 |
| 60 - 64 | B+ | 3.30 |
| 55 - 59 | B | 3.00 |
| 50 - 54 | B- | 2.70 |
| 45 - 49 | C+ | 2.30 |
| 40 - 44 | C | 2.00 |
| 35 - 39 | C- | 1.70 |
| 30 - 34 | D+ | 1.30 |
| 25 - 29 | D | 1.00 |
| 00 - 24 | E | 0.00 |

## 07. ශ්‍රේණි පටිපාටිය

අධ්‍යයන කටයුතු ඇගයීමේ දී පහත දැක්වෙන ශ්‍රේණි අක්ෂර සහ ශ්‍රේණි නොවන අක්ෂර ක්‍රමය භාවිත කරනු ලැබේ.

| ශ්‍රේණි අක්ෂර | විවරණය |
|---|---|
| A+, A , A- | විෂයෙහි පූර්ණ නිපුණතාවක් පෙන්වයි. A+ ශ්‍රේණියක් මගින් අතිවිශිෂ්ටත්වයක් පෙන්වයි. |
| B+, B, B- | පාඨමාලා ඒකකයේ විෂය කරුණු පිළිබඳ හොඳ අවබෝධයක්, මනා කුසලතාවක් සහ පාඨමාලා ඒකකයේ අවශ්‍යතා සහ ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් පූර්ණ නිරතවීමක් පෙන්නුම් කරයි. |
| C+, C, C- | පාඨමාලා ඒකකයේ විෂය කරුණු පිළිබඳ ප්‍රමාණවත් සහ සතුටුදායක අවබෝධයක් පෙන්නුම් කරයි. දෙන ලද පැවරුම් සම්පූර්ණ කිරීමේ සහ අධ්‍යයන කටයුතුවලට සහභාගී වීමේ මූලික අවශ්‍යතාව සපුරා ඇත. |
| D+, D, D- | අසතුටුදායක ශ්‍රේණියකි. අධ්‍යයන ක්‍රියාකාරකම් සඳහා අවම සහභාගීත්වයක් පෙන්නුම් කරයි. ඌන සාමර්ථ්‍ය ශ්‍රේණි වේ. |
| E | අසතුටුදායක ශ්‍රේණියකි. උපාධි සාමර්ථ්‍ය සඳහා සැලකිල්ලට ගනු නොලැබේ. අසමත්වීමක් නිරූපණය කෙරේ. |

## 08. ශ්‍රේණි නොවන අක්ෂර

| ශ්‍රේණි නොවන අක්ෂර | විවරණය |
|---|---|
| ABS | පූර්ව අනුමැතියක් නොමැති ව අවසන් විභාගයට පෙනී නො සිටින ශිෂ්‍යයන් සඳහා අසමත් සංකේතයක් ලෙස සැලකෙන මෙම සංකේතය ලැබෙනු ඇත. පිළිගත හැකි හේතු නොමැති ව ලබන ABS සංකේතය අසමත් වීමක් ලෙස සැලකේ. |
| DFR | පිළිගත හැකි හේතූන් මත කල් ලබා ගැනීම |
| EXL | විභාගයට පෙනී සිටීම හෝ ප්‍රතිඵල නිකුත් කිරීම අත්හිටුවා ඇත. |
| MED | වෛද්‍ය හේතු මත පෙනී නොසිටීම. |
| PASS/FAIL | A+ ශ්‍රේණියේ සිට B- ශ්‍රේණිය දක්වා වූ ශ්‍රේණි සමත් ශ්‍රේණි (PASS) ලෙස සැලකේ. C+ ශ්‍රේණියේ සිට පහළට සියලු ශ්‍රේණි අසමත් ශ්‍රේණි (FAIL) ශ්‍රේණි ලෙස සැලකේ. |

## 09. ශ්‍රේණි ලකුණු සාමාන්‍යය (GPA) ගණනය කිරීම

GPA අගය ගණනය කිරීමේ දී පහත සඳහන් සූත්‍රය භාවිත කෙරේ.

$$GPA = \frac{\sum^{N}=1 \text{ (Credit Value)*(Grade Point Earned)}}{\sum^{N}=1 \text{ (Credit Value)}}$$

සූත්‍රයෙහි දැක්වෙන පරිදි එක් එක් පාඨමාලාවන්හි දී අපේක්ෂකයා විසින් ලබා ගත් ලකුණුවල වටිනාකම උපයා ගත් ශ්‍රේණීන්ට අදාළ සංඛ්‍යාත්මක අගයෙන් වැඩි කිරීමෙන් GPA අගය ලබා ගත හැකි ය.

## 10. විශිෂ්ට සාමර්ථ්‍යය

- සියලු ම විෂය ඒකක සඳහා අවම අධ්‍යයන සම්භාර 30ක් ලබා ගත යුතු ය.
- සමස්ත උපාධි පාඨමාලාව සඳහා B හෝ ඊට ඉහළ ශ්‍රේණි ලබා තිබිය යුතු ය.
- සමස්ත උපාධි පාඨමාලාව සඳහා 4.00කට නොඅඩු ශ්‍රේණි ලකුණු සාමාන්‍යයක් ලබා ගත යුතු යි.
- සමස්ත පාඨමාලාව වසරක කාලයක් තුළ සම්පූර්ණ කර තිබිය යුතු ය.

**සාමර්ථ්‍යය**

- සියලු ම පාඨමාලා ඒකක සඳහා හෝ පාඨමාලා ඒකක 05ක් සඳහා B- හෝ ඊට ඉහළ ශ්‍රේණි ලබා තිබිය යුතු ය.
- ඉතිරි පාඨමාලා ඒකකය සඳහා C+ ශ්‍රේණි ලබා තිබිය යුතු ය.
- සමස්ත උපාධි පාඨමාලාව සඳහා 2.7ක ශ්‍රේණි ලකුණු සාමාන්‍යයක් ලබා ගත යුතු ය.

**ඌන සාමර්ථ්‍යය**

සමස්ත උපාධි පාඨමාලාව සඳහා 2.7කට නොඅඩු ශ්‍රේණි ලකුණු සාමාන්‍යයක් සමඟ පාඨමාලාවේ විෂය ඒකක එකකට හෝ දෙකකට C+ හෝ ඊට පහළ ශ්‍රේණි ලබා ඇති අපේක්ෂකයන් ඌන සාමර්ථ්‍යය ලැබූ අපේක්ෂකයන් ලෙස සැලකේ. එවැනි අපේක්ෂකයන්ට අසමත් විෂයන් සඳහා පමණක් පෙනී සිටිය හැක. ඊළඟ වසර 2ක් ඇතුළත එම ඌන සාමර්ථ්‍යලාභී විෂයයන් සම්පූර්ණ කළ යුතු ය.

**අසමත්**

සමස්ත උපාධි පාඨමාලාව සඳහා 2.7කට වඩා අඩු ශ්‍රේණි ලකුණු සාමාන්‍යයක් ඇති අපේක්ෂකයන් අසමත් අපේක්ෂකයන් ලෙස සැලකේ. එම අපේක්ෂකයන් විභාගයේ සියලු ම විෂයයන් සඳහා ඊළඟ වසර 02ක ඇතුළත නැවත පෙනී සිට පාඨමාලාව සම්පූර්ණ කර ගත යුතු ය.

## 11. පුනර්පරීක්ෂණ සාමර්ථ්‍යය

පාඨමාලා ඒකකයකින් අසමත් ව නැවත පෙනී සිටින අපේක්ෂකයෙකුට ලබා ගත හැකි උපරි ම ශ්‍රේණිය B- වේ. පුනර්පරීක්ෂණයක දී කලින් ලබා ගත් ශ්‍රේණියට වඩා අඩු ශ්‍රේණියක් ලබා ගෙන ඇති අවස්ථාවක දී කලින් ලබා ගෙන ඇති ඉහළ ශ්‍රේණිය ශිෂ්‍යයාට හිමි වේ.

## 12. වර්ෂාවසාන විභාගයට පෙනී නොසිටීම

වර්ෂාවසාන විභාගයට පෙනී නොසිටීමට බලපාන හේතු පහත දැක්වේ.

i වෛද්‍ය හේතු මත විභාගයට පෙනී නොසිටීම. (MED)
ii පිළිගත හැකි හේතු මත විභාගයට පෙනී නොසිට කල් ගැනීම. (DFR)
iii පිළිගත හැකි හේතුවක් නොමැති ව විභාගයට පෙනී නොසිටීම. (ABS)
(මෙම තත්ත්වය පාඨමාලා ඒකකයක අසමත්වීමක් ලෙස සලකනු ලැබේ.)

## 13. විභාගයට පෙනී නොසිටීම වෙනුවෙන් ඉදිරිපත් කරන වාර්තා -

සම්පූර්ණ පරීක්ෂණයට හෝ එහි කොටසකට පෙනී සිටීමට නොහැකි වන සේ රෝගාතුර වුවහොත් ඒ බව පශ්චාද් උපාධි හා බාහිර විභාග මධ්‍යස්ථානය වෙත ලිඛිත ව දැනුම් දිය යුතු ය. අදාළ පරීක්ෂණය අවසන් වී දින 14ක් ඇතුළත ඒ සම්බන්ධ දිස්ත්‍රික් වෛද්‍යවරයකුගෙන් හෝ රජයේ රෝහලක ලියාපදිංචි වෛද්‍යවරයෙකුගෙන් හෝ ලියාපදිංචි දේශීය වෛද්‍යවරයෙකුගෙන් ලබා ගත් වෛද්‍ය සහතිකයක් ඉදිරිපත් කළ යුතු ය. එම වෛද්‍ය සහතිකයෙහි පරීක්ෂණයට පෙනී නොසිටි දිනයන් ඇතුළත් වී තිබීම අත්‍යවශ්‍ය කරුණක් වේ.

වෛද්‍ය සහතිකය පිළිගත හැකි එකක් නම් පාඨමාලා ඒකකය සඳහා ශිෂ්‍යයාට MED ශ්‍රේණිය ලැබේ. මෙම ශ්‍රේණිය පළමුවර පෙනී සිටීමක් ලෙස නැවත පාඨමාලා ඒකකයට පෙනී සිටීමට සුදුසුකමක් වේ.

කිසියම් පාඨමාලා ඒකකයක් සඳහා නියමිත අඛණ්ඩ ඇගැයීම් ඉදිරිපත් නොකොට එම පාඨමාලා ඒකකය සඳහා වර්ෂාවසාන විභාගයට පෙනී සිටිය ද, එම විෂය ඒකකයෙන් අසමත් වුවෙකු ලෙස සැලකේ.

එසේ වුව ද කිසියම් පාඨමාලා ඒකකයක් සඳහා වන අඛණ්ඩ ඇගයීම ඉදිරිපත් කොට නියමිත පරිදි වර්ෂාවසාන විභාගයට පෙනී නොසිටි අවස්ථාවක විභාගය අවසන් වී දින 14ක් ඉක්මවීමට පෙර පිළිගත හැකි වෛද්‍ය වාර්තා (MED) හෝ වෙනත් වාර්තා (DFR) ඉදිරිපත් කළහොත් එය විභාගයට පළමුවරට පෙනී සිටීමක් සේ සලකනු ලැබේ. එය අදාළ වන්නේ එළඹෙන වර්ෂයේ පරීක්ෂණයට පෙනී සිටීම සඳහා පමණි.

## 14. තාවකාලික සහතික

පරීක්ෂණයේ ප්‍රතිඵල නිකුත් කරනු ලැබූ පසු අපේක්ෂකයන්ට බාහිර විභාග අංශයෙන් ලබා ගන්නා ලද අයදුම්පත්‍රයක් මගින් තාවකාලික සහතිකයක් ලබා ගැනීම සඳහා අයදුම් කළ හැකි ය. සති 02ක කාලයක් ඇතුළත තාවකාලික සහතික ලබා ගත හැකිය.

## 15. උපාධි සහතික සඳහා මුදල් ගෙවීම

- තාවකාලික ප්‍රතිඵල ලේඛනයක් සඳහා - රු. 100/-
- අතිරේක ප්‍රතිඵල ලේඛනයක් සඳහා - රු. 250/-
- විස්තරාත්මක ප්‍රතිඵල ලේඛනයක් සඳහා (Academic Transcript) - රු. 450/-
- උපාධි සහතිකය සඳහා - රු. 4500/-
  (මෙම ගාස්තු විටින් විට සංශෝධනය විය හැකි බව සලකන්න.)

දිවයිනේ ඕනෑ ම ලංකා බැංකු ශාඛාවකින්, ගිණුම් අංක 711202 ට **'ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය'** නමින් මුදල් ගෙවා ලබා ගන්නා ලදුපත පහත සඳහන් ලිපිනයේ පිහිටි කාර්යාලය වෙත ලියාපදිංචි තැපැල් මගින් එවා හෝ පැමිණ ඔබගේ සහතිකය ලබා ගත හැකි ය.

සහකාර ලේඛකාධිකාරී,
පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය හා බාහිර විභාග මධ්‍යස්ථානය,
ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය,
අංක 214, බෞද්ධාලෝක මාවත,
කොළඹ 07.

තැපැල් මගින් උපාධි සහතිකය ලබා ගැනීමට අපේක්ෂා කරන්නේ නම්,

- අන්තර්ජාලයේ www.bpu.ac.lk දරන විශ්වවිද්‍යාලයීය වෙබ් අඩවියේ ඇති **'උපාධි සහතිකය ලබා ගැනීමේ අයදුම්පත'** සම්පූර්ණ කර, දිවයිනේ ඕනෑ ම ලංකා බැංකු ශාඛාවකින්, **ගිණුම් අංක 711202**ට, **'ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය'** නමින් සහතිකයට අදාළ ගාස්තුව ගෙවා ලබා ගන්නා ලදුපත සමග තම නම, ලිපිනය ලියන ලද 9''x4'' ප්‍රමාණයේ රු. 45/-ක මුද්දර ඇලවූ කවරයක් ඉහත සඳහන් ලිපිනයට එවීමෙන් ලබා ගත හැකි ය. චෙක්පත් හෝ තැපැල් ඇණවුම් භාර ගනු නොලැබේ.

- සහතිකය ලබා ගැනීම සඳහා එවනු ලබන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අදාළ පාඨමාලාවේ නම සඳහන් කර, **'පශ්චාද් උපාධි සහතිකය ලබා ගැනීම'** යනුවෙන් සඳහන් කළ යුතු ය.

## 16. උපාධි සහතිකය

අවසාන උපාධි පරීක්ෂණයේ ප්‍රතිඵල සනාතන සභාව විසින් අනුමත කරනු ලැබූ පසු උපාධි සහතික පත්‍රය නිකුත් කරනු ලැබේ. උපාධි සහතිකයට අමතර ව විෂය නාම ශ්‍රේණි ඇතුළත් සහතික පත්‍රයක් ද නිකුත් කරනු ලැබේ.

## 17. උපාධිය වලංගු දිනය

සමස්ත ලිඛිත පරීක්ෂණය අවසන් වූ මාසයේ අවසන් දිනය උපාධිය වලංගු දිනය ලෙස සැලකේ.

**18. ලියාපදිංචි කාලය දීර්ඝ කිරීම**

සනාතන සභාව පිළිගනු ලබන හේතුන් මත ලියාපදිංචි කාලය දීර්ඝ කර ගත හැකි ය. එසේ වුව ද ලියාපදිංචි වූ වසරේ සිට වසර 03ක් තුළ පාඨමාලාවේ සියලු අවශ්‍යතා සම්පූර්ණ කළ යුතු යි.

# දෑවුරුදු ශාස්ත්‍රපති පාඨමාලාව

**01. SLQF 10 - 60 Credits**

**02. ලියාපදිංචිය සඳහා සුදුසුකම්**

- පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ විශ්වවිද්‍යාලයීය ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් කවර හෝ විෂයධාරාවක් යටතේ වසර 03කට නොඅඩු උපාධි පාඨමාලාවක් සමත් ව තිබීම.

  හෝ

- පිළිගත් විශ්වවිද්‍යාලයක එක් අවුරුදු ශාස්ත්‍රපති උපාධිය සමත් වීම.

  හෝ

- ශාස්ත්‍රපති උපාධියට හා විශේෂ ශාස්ත්‍රවේදී උපාධියට සමාන යැයි මෙම විශ්වවිද්‍යාලයේ සනාතන සභාව මගින් පිළිගනු ලබන වෙනත් සුදුසුකම් සපුරා තිබීම.

**03. පාඨමාලා ව්‍යුහය**

- දෑවුරුදු ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව සඳහා අධ්‍යයන සම්භාර ගණන 60කි.

| | | |
|---|---|---|
| එක් අවුරුදු ශාස්ත්‍රපති උපාධි පාඨමාලාවේ ලිඛිත පත්‍ර 06 සඳහා | - | අධ්‍යයන සම්භාර 30 |
| දෙවන වසර නිබන්ධය සඳහා | - | අධ්‍යයන සම්භාර 30 |

**04. විභාග නිර්ණායක**

- පාඨමාලාව බෞද්ධ අධ්‍යයන හා භාෂා අධ්‍යයන යනුවෙන් කොටස් දෙකකින් යුක්ත ය. පළමු වර්ෂය අධ්‍යයන ඒකක 06කින් සමන්විත වේ. (මෙම පාඨමාලාවේ අධ්‍යයන ඒකක එක් අවුරුදු ශාස්ත්‍රපති උපාධි පාඨමාලාවේ අධ්‍යයන ඒකක ම වේ)

- මෙම පාඨමාලාවේ පරීක්ෂණ පහත පරිදි වේ.

  (1) ලිඛිත පරීක්ෂණය
  (2) පර්යේෂණ සැලැස්ම ඉදිරිපත් කිරීම
  (3) ස්වාධීන පර්යේෂණ නිබන්ධය ඇගයීම
  (4) නිබන්ධ ප්‍රස්තුතීකරණය

පළමු වසරේ ලිඛිත පරීක්ෂණය සමත් විද්‍යාර්ථීන්ට දෙවන වසරේ ස්වාධීන පර්යේෂණ නිබන්ධිකාව සම්පූර්ණ කළ හැකි ය.

## 05. ලියාපදිංචිය

ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව සඳහා පළමු වර්ෂයේ ලියාපදිංචි දිනය දෑවුරුදු උපාධි පාඨමාලාවේ **ලියාපදිංචි දිනය** වශයෙන් සලකනු ඇත.

## 06. අධ්‍යයන කාලසීමාව

- පාඨමාලාවේ කාලය වසර 02කි. මෙම පාඨමාලාවේ වසර 02 සඳහා එකවර ලියාපදිංචි විය යුතු ය. එහෙත් එක් අවුරුදු පාඨමාලාව සඳහා ලියාපදිංචි වී සිටින අපේක්ෂකයෙකු දෑවුරුදු පාඨමාලාව සඳහා ලියාපදිංචි වීමට අපේක්ෂා කරන්නේ නම් පළමු වසර ලිඛිත පරීක්ෂණයට පෙර ඉල්ලුම් කළ යුතු ය. ලියාපදිංචි දිනයේ සිට වසර 05ක් තුළ පාඨමාලාවේ සියලු අවශ්‍යතා සම්පූර්ණ කළ යුතු ය.
- ඉන් පසු කිසි ම හේතුවක් මත කාලය දීර්ඝ කිරීම් නොකෙරේ.

## 07. ලියාපදිංචි කාලය දීර්ඝ කිරීම

- ලියාපදිංචිය දීර්ඝ කරනු ලබන්නේ උපරිම වර්ෂ 03කි. ලියාපදිංචියෙන් **වර්ෂ පහකට (05)** පසුව කිසිදු හේතුවක් මත කාලය දීර්ඝ නොකෙරේ.
- යම් අපේක්ෂකයෙකුට නියමිත කාලය තුළ පර්යේෂණය අවසන් කිරීමට නොහැකි වුවහොත් උපදේශකවරයාගේ නිර්දේශය අනුව කාලය දීර්ඝ කර ගත හැකි ය. (දීර්ඝ කරනු ලබන්නේ උපරිම වර්ෂ 03කි)
- අපේක්ෂකයාගේ ඉල්ලීම උපදේශකවරයා මගින් ඉදිරිපත් කළ යුතු ය. කාලය දීර්ඝ කිරීම වලංගු වන්නේ එක් වරකට එක් වසරකට පමණි. එහෙයින් සෑම ලියාපදිංචි වසරක් අවසන්වීමට මාස 03කට පෙර මෙම ඉල්ලීම ඉදිරිපත් කළ යුතු ය.

## 08. ස්වාධීන පර්යේෂණ නිබන්ධ උපදේශකවරු හා පරීක්ෂකවරු පත් කිරීම

### උපදේශකවරු පත් කිරීම

- පශ්චාද් උපාධි පීඨය මගින් යෝජනා කරනු ලබන නිබන්ධ උපදේශකවරු සනාතන සභාව මගින් අනුමත විය යුතු ය.
- සිය ස්වාධීන පර්යේෂණ නිබන්ධය සඳහා උපදේශකවරයෙකු යෝජනා කිරීමේ අයිතිය අපේක්ෂකයාට හිමි වන අතර, එම ඉල්ලීම සලකා බැලීම පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය සතු තීරණය වේ.

### ස්වාධීන පර්යේෂණ නිබන්ධ පරීක්ෂකවරු පත් කිරීම

- පශ්චාද් උපාධි පීඨය මගින් යෝජනා කරනු ලබන බාහිර පරීක්ෂකවරුන් දෙදෙනෙකු විසින් ස්වාධීන පර්යේෂණ නිබන්ධය පරීක්ෂා කළ යුතු ය.
- ස්වාධීන පර්යේෂණ නිබන්ධය පරීක්ෂා කිරීම සඳහා පත් කරනු ලබන පරීක්ෂකවරයාට උපරිම වශයෙන් මාස 03ක කාලයක් ලබා දෙනු ලැබේ. අදාළ කාලය තුළ පරීක්ෂණ වාර්තා නොලැබුණහොත් තවත් මාස 03ක් ඇතුළත සිහිකැඳවීම් 02ක් යොමු කරනු ලැබේ. එම කාලය ඇතුළත ස්වාධීන පර්යේෂණ නිබන්ධය පරීක්ෂා කිරීමට එම බාහිර පරීක්ෂකවරයා අසමත් වුවහොත් එය පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය සහ බාහිර විභාග මධ්‍යස්ථානයේ ප්‍රධානියා විසින් පශ්චාද් උපාධි පීඨයට වාර්තා කළ යුතු ය.
- එය සලකා බලා වෙනත් බාහිර පරීක්ෂකවරයෙකු පශ්චාද් උපාධි පීඨය විසින් පත් කළ යුතු ය.

## 09. ප්‍රගති වාර්තා ඉදිරිපත් කිරීම

සෑම මාස 06කට වරක් ම උපදේශකවරයාගේ නිර්දේශය සහිතව ප්‍රගති වාර්තා පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය හා බාහිර විභාග මධ්‍යස්ථානය වෙත ඉදිරිපත් කළ යුතුය.

## 10. උපදේශකවරයා වෙනස් කිරීම හෝ මාරු කිරීම

උපදේශකවරයා විදේශගත වීමේ දී හෝ වෙනත් පිළිගත හැකි හේතුවක් මත උපදේශකවරයා වෙනස් කර ගත හැකි ය. මෙම ඉල්ලීම පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය හා බාහිර විභාග මධ්‍යස්ථානයේ ලේඛකාධිකාරී වෙත ලිඛිතව කළ යුතුය. එම ඉල්ලීම උසස් උපාධි කමිටුවේ නිර්දේශය මත සනාතන සභාවේ අනුමැතිය සඳහා යොමු කරනු ලැබේ.

## 11. ස්වාධීන පර්යේෂණ නිබන්ධයේ ප්‍රමාණය

- වචන 40,000 කට නොඅඩු පර්යේෂණ නිබන්ධයක් ඉදිරිපත් කළ යුතු ය. එම කෘතිය අදාළ විෂය ක්ෂේත්‍රය පිළිබඳ සමකාලීන දැනුම පුළුල් කරන්නක් මෙන් ම නවතාවකින් යුක්ත වූවක් ද විය යුතු ය.

- නියමිත කාලය ඉක්මයෑමට පෙර නිබන්ධයේ පිටපත් තුනක් උපදේශකවරයාගේ නිර්දේශය සහිත ව පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය සහ බාහිර විභාග මධ්‍යස්ථානයට ඉදිරිපත් කළ යුතු ය.

## 12. ස්වාධීන පර්යේෂණ නිබන්ධය භාරදීම

- ස්වාධීන පර්යේෂණ නිබන්ධය භාරදීමට නියමිත දිනට මාස 03කට පෙර පශ්චාද් උපාධි හා බාහිර විභාග අධ්‍යයන මධ්‍යස්ථානය වෙත ලිඛිතව දැන්විය යුතුය.
- කිසියම් හේතුවකින් නියමිත දිනට ස්වාධීන පර්යේෂණ නිබන්ධය බාරදීමට නොහැකි වන්නේ නම් ඒ බව ලිඛිතව දැනුම් දිය යුතුය.
- ස්වාධීන පර්යේෂණ නිබන්ධය භාරදීමට පෙර ප්‍රගති වාර්තා හා සියලු අවශ්‍යතා සම්පූර්ණ කර තිබිය යුතුය.
- ස්වාධීන පර්යේෂණ නිබන්ධය භාර දෙන විට සියලු ගෙවීම් අවසන් කොට තිබිය යුතුය.
- තාවකාලික බැම්ම යොදා (Spirals Code) ස්වාධීන පර්යේෂණ නිබන්ධ පිටපත් 03ක් භාර දිය යුතුය.
- ස්වාධීන පර්යේෂණ නිබන්ධය භාර දෙන අවස්ථාවේ දී උපදේශක ආචාර්යවරයා විදේශගත වී හෝ මියගොස් ඇත්නම් උපදේශකවරයා වෙනුවට නිර්දේශ කිරීමේ අයිතිය අදාළ අධ්‍යයනාංශයේ අංශාධිපති වෙත බලය පැවරෙනු ඇත.

## 13. ස්වාධීන පර්යේෂණ නිබන්ධය ඇගයීම

- ස්වාධීන පර්යේෂණ නිබන්ධ පරීක්ෂකවරුන් දෙදෙනාම ස්වාධීන පර්යේෂණ නිබන්ධය සඳහා ලබාදෙන පරීක්ෂණ වාර්තාවේ දැක්වෙන එකගතාව මත උපාධිය ලබා දීම.
- මෙම උපාධිය පිරිනැමීම නුසුදුසු යැයි දෙදෙනාම නිර්දේශ කර ඇති විට ප්‍රතික්ෂේප කිරීම.
- දෙදෙනාගෙන් එක අයකු පමණක් නුසුදුසු යැයි පෙන්වා ඇත්නම් තෙවන පරීක්ෂකවරයෙකුට යොමු කිරීම.

## 14. වාචික පරීක්ෂණය

නිබන්ධ පරීක්ෂකවරුන්ගේ වාර්තා ලැබුණු පසු ස්වාධීන පර්යේෂණ නිබන්ධය පිළිබඳ වාචික පරීක්ෂණය (Viva Examination) පවත්වනු ලැබේ.

**වාචික පරීක්ෂණ මණ්ඩල සංයුතිය :**

✓ පශ්චාද් උපාධි අධ්‍යයන පීඨ මණ්ඩලයේ සභාපති
✓ අදාළ පීඨයේ පීඨාධිපති
✓ අදාළ අධ්‍යයනාංශයේ අංශාධිපති
✓ උපදේශකවරු
✓ නිබන්ධ පරීක්ෂකවරුන්
✓ ලේඛකාධිකාරී (පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය හා බාහිර විභාග මධ්‍යස්ථානයේ)

- අදාළ කමිටුව රැස්වී පරීක්ෂක වාර්තා සලකා බැලීමෙන් පසු කමිටුව ඉදිරියේ පර්යේෂණයේ සමස්තය පිළිබඳ විනාඩි 20ක ප්‍රස්තුතිකරණයක් අපේක්ෂකයා විසින් ඉදිරිපත් කළ යුතුය.

- අනතුරුව ස්වාධීන පර්යේෂණය පිළිබඳ වාචික පරීක්ෂණය පවත්වනු ලැබේ.

- පරීක්ෂකවරුන්ගේ වාර්තා, ප්‍රස්තුතිකරණය, ලිඛිත පරීක්ෂණයේ ලකුණු හා වාචික පරීක්ෂණය සලකා බලා අදාළ මණ්ඩලය විසින් ස්වාධීන පර්යේෂණ නිබන්ධය සඳහා උපාධිය පිරිනැමීම සුදුසුය/සංශෝධන වේ නම් ඒවා සකස් කිරීමට යටත්ව උපාධිය පිරිනැමීම සුදුසුය/උපාධිය පිරිනැමීම නුසුදුසුය යන තීරණයට එළඹෙනු ලැබේ.

- පරීක්ෂක වාර්තාවලින් නිර්දේශ කර ඇති සංශෝධන හා වාචික පරීක්ෂණයේ දී නියම කරනු ලබන සංශෝධන අදාළ කමිටුව විසින් යෝජනා කරනු ලබන කාලසීමාව තුළ සකස් කොට උපදේශකවරයාගේ නිර්දේශය සහිතව ස්වාධීන පර්යේෂණ නිබන්ධය භාරදිය යුතුය.

**සාමාන්‍ය සංශෝධන**

යම් ස්වාධීන පර්යේෂණ නිබන්ධයක් සංශෝධනවලට යටත්ව පිළිගත යුතුයැයි නිර්දිෂ්ට වූ විට පර්යේෂකයා විසින් මාස 03ක කාලයක් තුළ දී පරීක්ෂණ කමිටුවේ උපදෙස් පරිදි අවශ්‍ය සංශෝධන සිදු කළ යුතුය. අනතුරුව මේ සඳහා අවශ්‍ය සංශෝධන නිසි පරිදි සිදු වී ඇති බවට උපදේශකවරුන් සහතික කළ යුතුය.

**ප්‍රධාන සංශෝධන**

ස්වාධීන පර්යේෂණ නිබන්ධයෙහි සැලකිය යුතු තරම් විශාල සංශෝධනයක් සිදුවිය යුතුයැයි නිර්දිෂ්ට වූ විට එම සංශෝධන නිසි පරිදි සිදුකර වාචික පරීක්ෂණය සිදුකළ දින සිට වර්ෂයක කාලයක් ඇතුළත අපේක්ෂකයා විසින් ස්වාධීන පර්යේෂණ නිබන්ධය ආයතනය වෙත භාරදිය යුතුය. එවිට එම ස්වාධීන පර්යේෂණ නිබන්ධය නැවත වරක් පරීක්ෂකවරුන් වෙත යැවෙන අතර පරීක්ෂකවරුන්ගේ වාර්තා අනුව නැවත වාචික පරීක්ෂණයක් පවත්වනු ලැබේ.

එහි තීරණය මත නිබන්ධය උපාධිය ප්‍රදානය කිරීම සඳහා පිළිගනු ලැබුවහොත් උපාධිය ක්‍රියාත්මක වන දිනය ලෙස සැලකෙනුයේ සංශෝධිත ස්වාධීන පර්යේෂණ නිබන්ධය ආයතනය වෙත භාරදුන් දිනයයි. මෙම කාරණයෙහි ලා ආයතනයට දැරීමට සිදුවන අමතර පිරිවැය අපේක්ෂකයා විසින් ආයතනයට ගෙවිය යුතුය.

- පශ්චාද් උපාධි අපේක්ෂකයින් විසින් ඉදිරිපත් කරනු ලැබූ ස්වාධීන පර්යේෂණ නිබන්ධය අදාළ පරීක්ෂණයේ දී සුදුසු යැයි පිළිගන්නේ නම් නිබන්ධයේ පිටපත් 03ක් ස්ථිර බැම්මෙන් බැඳ උපදේශක/අංශාධිපතිවරයා මගින් පශ්චාද් උපාධි හා බාහිර විභාග අධ්‍යයන මධ්‍යස්ථානය වෙත භාර දි යුතුයි.

## 15. තාවකාලික සහතික

වාචික පරීක්ෂණයෙන් පසුව අපේක්ෂකයන්ට බාහිර විභාග අංශයෙන් ලබා ගන්නා ලද අයදුම්පත්‍රයක් මගින් තාවකාලික සහතිකයක් ලබා ගැනීම සඳහා අයදුම් කළ හැකි ය. සති 02ක කාලයක් ඇතුළත තාවකාලික සහතික ලබා ගත හැකි ය.

## 16. උපාධි සහතික සඳහා මුදල් ගෙවීම

- තාවකාලික ප්‍රතිඵල ලේඛනයක් සඳහා - රු. 100/-
- අතිරේක ප්‍රතිඵල ලේඛනයක් සඳහා - රු. 250/-
- උපාධි සහතිකය සඳහා - රු. 4500/-

(මෙම ගාස්තු විටින් විට සංශෝධනය විය හැකි බව සලකන්න.)

දිවයිනේ ඕනෑ ම ලංකා බැංකු ශාඛාවකින්, ගිණුම් අංක 711202 ට **'ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය'** නමින් මුදල් ගෙවා ලබා ගන්නා ලදුපත පහත සඳහන් ලිපිනයේ පිහිටි කාර්යාලය වෙත ලියාපදිංචි තැපැල් මගින් එවා හෝ පැමිණ ඔබගේ සහතිකය ලබා ගත හැකි ය.

සහකාර ලේඛකාධිකාරී,
පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය හා බාහිර විභාග මධ්‍යස්ථානය,
ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය,
අංක 214, බෞද්ධාලෝක මාවත,
කොළඹ 07.

තැපැල් මගින් උපාධි සහතිකය ලබා ගැනීමට අපේක්ෂා කරන්නේ නම්,

- අන්තර්ජාලයේ www.bpu.ac.lk දරන විශ්වවිද්‍යාලයීය වෙබ් අඩවියේ ඇති **'උපාධි සහතිකය ලබා ගැනීමේ අයදුම්පත'** සම්පූර්ණ කර, දිවයිනේ ඕනෑ ම ලංකා බැංකු ශාඛාවකින්, **ගිණුම් අංක 711202**ට, **'ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය'** නමින් සහතිකයට අදාළ ගාස්තුව ගෙවා ලබා ගන්නා ලදුපත සමග තම නම, ලිපිනය ලියන ලද 9''x4'' ප්‍රමාණයේ රු. 45/- ක මුද්දර ඇලවූ කවරයක් ඉහත සඳහන් ලිපිනයට එවීමෙන් ලබා ගත හැකි ය. චෙක්පත් හෝ තැපැල් ඇණවුම් භාර ගනු නොලැබේ.

- සහතිකය ලබා ගැනීම සඳහා එවනු ලබන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අදාළ පාඨමාලාවේ නම සඳහන් කර, **'පශ්චාද් උපාධි සහතිකය ලබා ගැනීම'** යනුවෙන් සඳහන් කළ යුතු ය.

**17. උපාධි සහතිකය**

වාචික පරීක්ෂණයේ ප්‍රතිඵලය සනාතන සභාව විසින් අනුමත කරනු ලැබූ පසු උපාධි සහතික පත්‍රය නිකුත් කරනු ලැබේ.

**18. උපාධිය වලංගු දිනය**

ස්වාධීන පර්යේෂණ නිබන්ධය භාර දුන් දිනය උපාධිය වලංගු දිනය ලෙස සැලකේ.

ඒ වන විට ස්වාධීන පර්යේෂණ නිබන්ධය භාර නොදුන් සිසුන් සඳහා ස්වාධීන පර්යේෂණ නිබන්ධය භාර දුන් දිනය උපාධිය වලංගු දිනය ලෙස සලකනු ලැබේ.